**ටවර් හෝල් රඟහල පදනම- 2013**

**-------------------------------------**

ටවර් හෝල් රඟහල පදනමේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ

අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

2.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

2.2.1 <u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත</u>

<u>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.135,835,222 ක් හා ශුද්ධ අගය රු.16,969,479 ක් වූ දේපල, පිරියත හා උපකරණ විෂයයන් 11 ක් තුළ ඇතුළත්, සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද එහෙත් තවමත් භාවිතයට ගන්නා, අපහරණය කිරීමට ඇති වත්කම් හා නිෂ්කාර්ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) පිරිවැය රු.258,942 ක් වූ වත්කම් විෂයයන් 21 ක් බැහැර කරන ලද ලෙස සලකා ගිණුම් වලින් ඉවත් කළයුතුව තිබුණද ඒවායේ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඇ) ඵලදායී ජීවිත කාලය ඉහළ යන පරිදි ටවර් රඟහලේ වායුසමන පද්ධතිය නවීකරණය සඳහා වැයකර තිබුණු ප්‍රාග්ධන ස්වරූපයේ රු.1,636,320 ක වියදම සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියාහැර තිබුණි.

2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූලව වර්ෂයේ ක්ෂය වෙන්කිරීම් සිදුනොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලිවලට අදාල ක්ෂය වටිනාකම රු.408,586 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) නාට්‍ය පාසැලේ සිසුන් සඳහා ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් 2012 වර්ෂයේදී ලැබුණු රු.124,600 ක මුදල අදාළ ශිෂ්‍යත්ව ගිණුමකට බැර නොකර අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.3 <u>නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 102 සහ 757 (2) | 2012 වර්ෂයට අදාළව සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වී තිබුණු භාණ්ඩ වර්ග 58 කට අදාළ අයිතම 327 ක ඌනතාවයන් පිළිබඳව මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 702 හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ඡේදය | එල්ෆින්ස්ටන් රඟහල නවීකරණ කටයුතු සඳහා ශ්‍රමදායකත්ව ලබාගත් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ එකඟතා ගිවිසුමකට එළඹී නොතිබූ අතර මිනිස් දින 20,073 ක සේවය වෙනුවෙන් රු.9,032,850 ක් එම දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 756 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කිරීම සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ ඊට ආසන්නව සිදුකළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කිරීම හා භාණ්ඩ සමීක්ෂණය 2014 ජුනි වන විටත් සිදුකර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති PED/12 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | පදනම විසින් සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට රු.103,548,271 ක ස්ථාවර තැන්පත් හා රු.25,300,000 ක සත්දින ඇමතුම් තැන්පතුවල මුදල් ආයෝජනය කර තිබුණද චක්‍රලේඛ උපදෙස් පරිදි ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂයේ ටවර් හෝල් රඟහල පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,370,607 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,411,238 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ඌනතාවයෙහි රු.3,040,631 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ත ආදායම රු.3,813,044 කින් වැඩිවී තිබීම හා සමස්ත වියදම රු.772,413 කින් පමණක් වැඩිවීම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සකස් කරන ලද සැලසුම් අනුව, වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වන විට එල්ෆින්ස්ටන් රඟහල නවීකරණයට අදාළව ආසන සවිකිරීම, ටයිල් ඇතිරීම හා විදුලි ආලෝක පද්ධතිය සැකසීම සම්බන්ධ රු.47,700,000 ක ඇස්තමේන්තුගත කාර්යයන් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද, 2014 මාර්තු දක්වා එම කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. එම කටයුතු වල සංකීර්ණ බව සහ නවීකරණ කටයුතු සඳහා අරමුදල් ලැබීමේ ප්‍රමාදයද ඒ සඳහා හේතුවී තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ තුන්වන කාර්තුව අවසන් වන විට රුක්මණී දේවී රඟහලෙහි හා ටවර් රඟහලෙහි නවීකරණ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඒ සඳහා රු.4,115,000 ක් වෙන්කර තිබුණද 2014 මාර්තු 31 දින දක්වා එම කටයුතු ආරම්භ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර රු.5,950,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු වෙනත් වැඩ සටහන් 06 ක් සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ටවර් හෝල් පදනම විසින් පවත්වාගෙන යනු ලබන රුක්මණීදේවී රංග ශාලාවේ ආදායම සේවකයන්ගේ වැටුප් ගෙවීමට හෝ ප්‍රමාණවත් වී නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී එහි ආදායම රු.474,050 ක් වුවද සේවක වැටුප් වියදම රු.1,469,158 ක් වී තිබුණු අතර, 2012 වර්ෂයේදී ද ආදායම රු.824,830 ක් හා සේවක වැටුප් වියදම රු.1,268,412 ක් විය. රංග ශාලාවේ නඩත්තු වියදම්වත් ආවරණය කරගත හැකිවන පරිදි එහි ආදායම වැඩිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී භාරකාර මණ්ඩල රැස්වීම් 9 ක් පවත්වා තිබුණි. නිල තත්ත්වය අනුව රැස්වීම සඳහා සහභාගී විය යුතු භාරකාර මණ්ඩල සාමාජිකත්වය දරන පළාත් සහ පළාත් පාලන කටයුතු පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා සහ කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිවරයා එකම රැස්වීම් වාරයකටවත් සහභාගී නොවීම පිළිබඳව භාරකාර මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

4.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

මූලික සැලසුමක් නොමැතිව රු.195,000 ක් වියදම් කරමින් මහව හා පොල්පිතිගම පැවැත්වූ නාට්‍ය වැඩ සටහන පැවැත්වීමේ අරමුණ හා පවත්වන්නේ කවුරුන් වෙනුවෙන්ද තීරණය කර නොතිබුණි. තවද ඒ සඳහා ටවර් හෝල් පදනමේ සම්පත්දායකයින් හෝ නිලධාරීන් සහභාගී වී නොතිබූ අතර එහි අධීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.

4.4 **අරමුදල් ඌන උපයෝජනය**

රුක්මණිදේවි රඟහල නවීකරණ කටයුතු වෙනුවෙන් භාණ්ඩාගාරය විසින් 2012 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල ලබාදී තිබුණු රු.මිලියන 7.5 ක් අදාළ අරමුණ වෙනුවෙන් යොදා නොගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සත්දින ඇමතුම් තැන්පතු වල යොදවා තිබුණු අතර එම රඟහලේ නවීකරණ කටයුතු 2013 අවසාන වන විටත් ආරම්භ කර නොතිබුණි. මෙයට අතිරේකව ප්‍රාග්ධන වියදම් සඳහා 2011 නොවැම්බර් 11 දින භාණ්ඩාගාරය විසින් ලබාදී තිබුණු රු.මිලියන 20 ක් අදාළ කාර්යය සඳහා යොදවා නොගෙන වරින් වර සත්දින ඇමතුම් තැන්පතු වල ආයෝජනය කර තිබුණි.

4.5 **වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් සම්පත්**

ටවර් හෝල් රඟහල පදනම සතු කැබ් රථයක් සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයකුගේ පරිහරණය සඳහා ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසය තුළ එය කි.මී.2634 ක් දුර ධාවනයේ යොදවා තිබුණි.

4.6 **කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පදනමේ අනුමත කාර්ය මණ්ඩලය 86 ක් වුවද එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 61 ක් විය. පුරප්පාඩු කාර්ය මණ්ඩල තනතුරු අතරින් විධායක මට්ටමේ තනතුරු 06 ක්ද පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 දෙසැම්බර් 23 දින සිට එම තනතුරට පත්වී තිබෙන පදනමේ වර්තමාන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත එම තනතුරට අදාල HM– 1- 7 දරන වැටුප් පරිමානයේ ආරම්භක වැටුප් තලයේ සිට වැටුප් වර්ධක 15 ක් ලබාදී උපරිම වැටුප් තලයට අදාල රු.55,030 ක්වූ වැටුපෙහි පිහිටුවා 2007 මාර්තු 01 දින සිට වැටුප් ගෙවා තිබුණි. 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 හා 2009 මැයි 06 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් තීරණය කිරීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ද ලබාගත යුතු වුවත් එයට පටහැනිව භාරකාර මණ්ඩල තීරණයක් මත එසේ වැටුප් ගෙවා තිබුණු අතර, සේවා කාලය වර්ෂ 1 ක් වැනි කාලයක් තුල වැටුප් වර්ධක 15 ක් ලබාදීමට හේතු වූ පිළිගත හැකි සාධාරණ කරුණු විගණනයට ඉදිරිපත් නොවුණි.

5. **<u>ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය</u>**

5.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 6.5.1 ඡේදය අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද්දේ 2014 ජූනි 20 දිනදීය.

5.2 **<u>සංයුක්ත සැලැස්ම</u>**

2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී/12 හි 5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5.3 **<u>අයවැය ලේඛනමය පාලනය</u>**

2013 වර්ෂයේ සංශෝධිත අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම හා වියදම වර්ෂයේ තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 32 සිට සියයට 580 දක්වා වූ විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

5.4 **වාර්ෂික වාර්තා සභාගත කිරීම**

ටවර් හෝල් රඟහල පදනම විසින් 2011 හා 2012 වාර්ෂික වාර්තා 2014 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය
(ආ) ගිණුම්කරණය
(ඇ) තොග පාලනය
(ඈ) සේවක මණ්ඩල පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය